# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 8 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1974 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 8 දරන මහා නගර සභා
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

ඇල්.ඩී.—ඕ. 40/73.

මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම
සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 8 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මහා නගර සභා ආඥාපනතේ 277 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 252 වන අධිකාරයේ 277 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) මේ ආඥාපනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් සභාව හෝ නගරාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සතු කරනු ලැබුවා වූ ද එකී නියමයෙහි හෝ එම නියමය සංශෝධනය කරන වෙන යම් නියමයක හෝ නියමවල දක්වෙන් නා වූ ද අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය හා කටයුතු සතුව සිටීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, ඉටු කිරීමට සහ කිරීමටත් විශේෂ කොමසාරිස්වරයකු හෝ විශේෂ කොමසාරිස්වරුන් ප්‍රකාශිත කාල සීමාවකට හෝ කලින් කල ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්";
සහ

(2) එම වගන්තියේ (3අ) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3අ) සභාව විසුරුවා හැරීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ විශේෂ කොමසාරිස්වරයකු හෝ විශේෂ කොමසාරිස්වරුන් පත්කිරීමෙන් පසු කවර විටක වුව ද, විසුරුවා හරින ලද මහා නගර සභාව වෙනුවට මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම මහා නගර සභා ප්‍රදේශය සඳහා අලුත් මහා නගර සභාවක් සංස්ථාපනය කළ යුතු යයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය.".

2—ඒ 05132—10,665 (74/4)